රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 135

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
පිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 1979 අප්‍රියෙල් මස 03 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානයන් වෙත.

රාජ්‍ය නිලධරයන්, පළාත්පාලන සහ වෙනත් රාජ්‍ය අංශයේ
සේවකයන්ගේ සේවය වෛකල්පික විශ්‍රාම වයසින් ඔබ්බට
දීර්ඝ කිරීම.

සියලුම රජයේ නිලධරයන්ද, පළාත්පාලන සේවකයන්ද, රාජ්‍ය සංස්ථාවන්හි සේවකයන්ද පිළිබඳව අදාල ඇමතිවරයාගේ නිර්දේශයක් මත වයස අවුරුදු 58 න් ඔබ්බට සේවය දිගු කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය තමන් වෙත රඳවා ගෙන ඇත.

02. වෛකල්පික විශ්‍රාම වයසින් ඔබ්බට වයස අවුරුදු 58 දක්වා සේවය දිගුකිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය සේවා කොමිසමට පවරා ඇති අතර, රාජ්‍ය සේවා කොමිසම එක් එක් අමාත්‍යාංශයේ ලේකම්වරයාට තම අමාත්‍යාංශයේ සියලුම රජයේ නිලධරයන් පිළිබඳ එකී බලය පවරා ඇත. ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන් බලය පැවරී ඇත්තේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට වන අතර, අදාල ලේකම්වරුන් නිර්දේශය කළයුතු වන්නේ මොහු වෙතය. සේවය දීර්ඝ කිරීමේදී, ලේකම්වරයා අදාල ඇමතිවරයා විමසිය යුතුය.

03. වෛකල්පික විශ්‍රාම වයසින් ඔබ්බට අවුරුදු 58 දක්වා පළාත්පාලන සේවකයන්ගේත්, රාජ්‍ය සංස්ථා සේවකයන්ගේත් සේවය දිගු කිරීමේ බලය අදාල ලේකම්වරයාට දී ඇත. එසේ දිගු කිරීමේදී ඔහු අදාල ඇමතිවරයා විමසිය යුතුය.

04. නීතියක හෝ ගිවිසුම් බැඳීමක වෙනත් අන්දමකට විධිවිධාන සලසා ඇත්නම්, රජයේ සංස්ථාවන්හි සේවකයන්ගේ සේවය දිගු කිරීමේදී එකී නීතිය හෝ ගිවිසුම් බැඳීම බලපැවැත්වෙන්නේය.

05. වයස අවුරුදු 55 ට එළඹියද, අවුරුදු 10 ක විශ්‍රාම වැටුප් හිමි සේවය සම්පූර්ණ කර නොමැති විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ රජයේ නිලධරයකුට වයස අවුරුදු 58 ට එළඹීම හෝ අවුරුදු 10 ක විශ්‍රාම වැටුප් හිමි සේවය සම්පූර්ණ කිරීම යන දෙකෙන් කලින් සිදුවන්නේ කවරක්ද, ඒ දක්වා සේවයේ රැඳී සිටීමට අවසර දීම, තම ඇමතිවරයා විමසමින් අදාල ලේකම් වරයාට කළහැක. ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන්

අදාල ලේකම්වරයා වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා වන අතර, එම නිලධරයා සේවයේ නියුතුව සිටින අමාත්‍යාංශය භාර ලේකම්වරයා නිර්දේශය කළයුතු වන්නේ මොහු වෙතය. මෙකී හේතුව නිසාම වයස අවුරුදු 58 න් ඔබ්බට සේවය දිගුකරනු ලබන්නේ, අදාල ඇමතිවරයාගේ යොමු කිරීමක් මත අමාත්‍ය මණ්ඩලය පමණි.

06. පහත දැක්වෙන රජයේ නිලධර කොටස් සම්බන්ධයෙන් අදාල ඇමතිවරයා විසින් වයස අවුරුදු 58 න් ඔබ්බට අවුරුදු 60 දක්වා සේවය දිගු කිරීමේදී දැනට අනුගමනය කරන ක්‍රියා මාර්ගයෙහි වෙනසක් සිදු නොවේ. එකී සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් අදාල ඇමතිවරයා වන්නේ රාජ්‍ය පරිපාලන ඇමතිවරයාය.

(අ) ඉන්ජිනේරුවන්
(ආ) වෛද්‍ය නිලධරයන්
(ඇ) ගණකාධිකාරීන්
(ඈ) කාර්මික ශ්‍රේණිවල නිලධරයන්
(ඉ) ලඝුලේඛකයන් (ඉංග්‍රීසි)
(ඊ) යතුරු ලේඛකයන් (ඉංග්‍රීසි)
(උ) නියෝජ්‍ය විගණකාධිපති
(ඌ) සහකාර විගණකාධිපතීන්, සහ
(එ) විගණන අධිකාරීන්

07. 1975.04.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 95 මෙයින් අවලංගු කෙරේ.

Siriwardhana

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

## සංචිත සේවක වාර්තාව.

'ඒ' වර්ගය/'බී' වර්ගය (අනවශ්‍ය කොටස් කපා හරින්න.)

1. සම්පූර්ණ නම:
2. උපන් දිනය:
3. 1979 මැයි මස 31 වන දිනට වයස:
4. පදවි නාමය:
5. දැනට සිටින අමාත්‍යාංශය:
6. දැනට සිටින දෙපාර්තමේන්තුව:
7. ශ්‍රේණිය හා පන්තිය සමග සේවා නාමය:
8. සේවයට ඇතුළත්වූ දිනය:
9. වත්මන් වැටුප් පරිමාණය:
10. 1979 මැයි 31 වන දිනට වැටුප:
11. මාරු කරන අවස්ථාවේ වැටුප් විස්තර (එනම්: සංචිතයේ සේවකයින්ගේ සියළුම දීමනා ඇතුළත්ව ආදිය සමග 1979 මැයි මාසයේ සම්පූර්ණ වැටුප් ලැයිස්තුව):
12. සංචිතයට මාරු කිරීමට හේතු:
(අනවශ්‍ය කොටස් කපා හරින්න.)
    I. 'ඒ' වර්ගය යටතේ අතිරික්ත
    II. 'බී' වර්ගය යටතේ (I) අකාර්යක්ෂමතාව හෝ අදක්ෂ භාවය
    (II) රාජ්‍ය විරෝධී කටයුතුවල නියැළීම

ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ

අත්සන සහ පදවි නාමය.

දිනය: